2nd International Conference of Multidisciplinary Approaches (iCMA), 2015
Faculty of Graduate Studies,
University of Sri Jayewardenepura,
Sri Lanka

ISSN: 2386 – 1509
Copyright © iCMA


# ආර්ථික යුක්තිය පිළිබඳ බෞද්ධ ආකල්පය

**මැටිබැඹියේ ධම්මසිරි හිමි**

**පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.**

*ෟය්පජීසරස85?ටප්සකගජදප*

බෞද්ධ දර්ශනය තුළින් පෙන්වා දී ඇති යුක්ති ධර්මය සමස්ත මානව සමාජයේ පදනම වශයෙන් පෙන්වාදිය හැකි ය. යුක්ති සහගතව උපයා ගන්නා ලද ධනය පරිභෝජනය කිරීම ද යුක්ති සහගතව කළ යුතු ය. මිනිසාගෙන් තොර සමාජයක් හෝ සමාජයෙන් තොර මිනිසෙක් නොමැත. ධාර්මිකව ඉපැයූ දෙයින් තමා සුවපත් විය යුතු ය. යුක්ති සහගතව සැප අනුභව කළ යුතු ය. "අත්තානං සුඛෙති පිණෙති සම්මා සුඛං පරිහරති." යනුවෙන් ධනය පරිභෝජනය කිරීමේ දී වැරදි ආකාරයෙන් හා සමාජයට කරදරවන අයුරින් එය පුද්ගලයන් විසින් සිදු කරන නිසා "සම්මා සුඛං පරිහරති" යනුවෙන් යුක්ති ධර්මය පිළිබඳ අවධානය යොමු කර ඇති බව පැහැදිලි ය. එහිදි යුක්ති ධර්මයට අනුව අර්ථිකය සකස්කරගත යුතු අයුරු අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් අපේක්ෂා කෙරේ.

බුදුදහමට අනුව ධන පරිහරණය අරපිරිමැස්මෙන් කළ යුතු ය. ආනන්ද තෙරුන්ට ධර්ම පූජාවක් වශයෙන් ලැබුණු රෙදිපිළි පන්සියයක් අරමුණු කරගෙන කොසොල් රජු හා ආනන්ද තෙරුන් අතර සිදුවූ සංවාදයෙන් පැහැදිලි වන්නේ අරපිරිමැස්මේ ඇති වටිනා කමයි. භික්ෂු සමාජයේ ද සාධාරණ භෝගී ලෙස ලද දෙය පරිහරණය කිරීමට සුදුසු බව පෙන්වා දී ඇත. දසවිධ කාමභෝගීන් අතරින් උතුම්ම පුද්ගලයාගේ ලක්ෂණ කිහිපයක් පෙන්වා දී ම තුළින් ද ඒ බව පැහැදිලි ය. එනම් යුක්ති ධර්මයෙන් භෝග සෙවීම, තමා ඒ තුළින් සතුටුවීම, සංවිභාග කිරීම, භෝගයන්හි නොබැඳී සිටීම සීමාව නො ඉක්මවා ආදීනව දකිමින් පරිභෝජනය කිරීම සුදුසු බව පෙන්වාදී ඇත.

අනවජ්ජ සුඛය නම් වැරදී සහගත ක්‍රීයාවන්ගෙන් වෙන් වීමෙන් ලබන සතුටයි. නිෂ්පාදනය, පරිභෝජනය වැනි කාර්යන් හිදී සිත, කය, වචනය යන තුන්දොර සංවර කර යුක්ති ගරුකව කටයුතුවල නිරත වීම අනවජ්ජ සුඛය වශයෙන් හඳුන්වනු ලබයි. ලෞකික ප්‍රගතියෙහි මෙන්ම ආධ්‍යාත්මික ප්‍රගතියෙහි ද පදනම වන්නේ ශීලයයි. සීල සූත්‍රයෙහි ආනිසංස පහෙන් හතරක්ම ලෞකික ප්‍රතිඵල වන අතර එයින් පළමු වැන්න ආර්ථික සමෘද්ධිය යි. සීලවන්ත පුද්ගලයා අප්‍රමාද හේතුවෙන් මහත් භෝගයන් රැසක් ලබයි. සීලය ආරක්ෂා කිරීමෙන් නාස්තිය, දූෂණය, සොරකම, වංචාව පුද්ගලයා තුළින් නිරන්තරයෙන් වැළකී යයි. ආර්ථිකයේ දී මෙවැනි යුක්ති ධර්මයක් අනුගමනය කිරීමෙන් පුද්ගලයාට දියුණුව වෙත ලඟාවිය හැකි අයුරු බුද්ධ දේශනාව තුළින් පෙන්වා දී ඇති බව පැහැදිලි ය.

ප්‍රමුඛ පද :- ආර්ථිකය, යුක්තිය, පුද්ගලයා, ධර්මය, දියුණුව